THE INSTITUTE OF CHARTERED ACCOUNTANTS OF SRI LANKA

SUGGESTED SOLUTIONS

NOT FOR SALE

KE3-Fundamentals of Taxation & Law

මාර්තු 2016

All Rights Reserved

A කොටස

බහුකරණය

01 කොටස

ප්‍රශ්න අංක 01

1.1

අදාල ඉගෙනුම් ඵලය1.1.2.	
නිවැරදි පිළිතුර A	

1.2

අදාල ඉගෙනුම් ඵලය 3.1.3	
නිවැරදි පිළිතුර C	

1.3

අදාල ඉගෙනුම් ඵලය 4.1.1	
නිවැරදි පිළිතුර D	

1.4

අදාල ඉගෙනුම් ඵලය 4.2.2	
නිවැරදි පිළිතුර B	

1.5

අදාල ඉගෙනුම් ඵලය 5.2.3	
නිවැරදි පිළිතුර D	

(මුළු ලකුණු 10)

NOT FOR SALE

ප්‍රශ්න අංක 02

2.1

අදාල ඉගෙනුම් ඵලය 2.12.
දේශීය ආදායම් පනතේ අර්ථ නිරූපණය අනුව තැනැත්තා යන්නට සමාගමක්, පුද්ගල මණ්ඩලයක් හෝ යම් ආණ්ඩුවක් ඇතුලත් වේ.

2.2

අදාල ඉගෙනුම් ඵලය 3.1.2	
වෙළඳාමෙන් ලද ආදායම	1,800,000
පොලී ආදායම - දළ (45,000/90*100)	50,000
මුළු ව්‍යවස්ථාපිත ආදායම	1,850,000
ලැබු ලාභාංශ - ව්‍යවස්ථාපිත ආදායමේ කොටසක් නොවේ.	

2.3

අදාල ඉගෙනුම් ඵලය 3.1.4		
බදු අයකළ හැකි ආදායම මත බද්ද	456,000 x 12% =	54,720
ලාභාංශ බෙදා හැරීම මත බද්ද	100,000 x 10% =	10,000
		64,720

2.4

අදාල ඉගෙනම් ඵලය 4.4.3
• වැඩිපුර ගෙවූ බදු මුදල් ආපසු ගෙවීමක් ලෙසට (i) ආදායම් බදු වාර්තාව මගින්ම හෝ (ii) සංශෝධිත බදු වර්තාවක් ඉදිරිපත් කිරීමෙන් හෝ (iii) ලිඛිත ඉල්ලීමක් ලෙස තක්සේරු වර්ෂය අවසානයේ වසර තුනක් නොඉක්මවීමට පෙර සිදුකිරීමෙන් හිමිකම් පෑමක් කළහැකිය.

2.5

අදාල ඉගෙනුම් ඵලය 5.1.2			
නිමැවුම් බද්ද	234,000,000 x 11%		25,740,000
යෙදවුම් බද්ද			
දේශීය ගැනුම් මත		10,545,000	
මෝටර් රථය මත		(327,000)	
			(10,218,000)
ගෙවිය යුතු VAT බද්ද			**15,522,000**

(මුළු ලකුණ 10)

NOT FOR SALE

2 කොටස

ප්‍රශ්න අංක 03

අදාල ඉගෙනුම් ඵල
2.2 දේශීය ආදායම් පනතේ ව්‍යවස්ථාපිත ආදායමේ මූලාශ්‍ර ලැයිස්තු ගත කර ඇත. 2.3 එකතු ව්‍යවස්ථාපිත ආදායම, තක්සේරු ආදායම හා බදු අයකළ හැකි ආදායම. 2.4 දල ආදායම් බද්ද සහ ගෙවිය යුතු ඉතිරි බද්ද

ගෝමස් මහතා ගේ
2014/2015 තක්සේරු වර්ෂය සඳහා
ආදායම් බදු වගකීම ගණනය කිරීම

සේවා නියුක්තියෙන් ලද ආදායම		රු.	රු.
දළ වැටුප	165,000 x 12	1,980,000	
2014/2015 වර්ෂය තල ලද ප්‍රසාද දීමනාව		200,000	
රථ වාහන දීමනාව රු. 50,000 දක්වා නිදහස්	540,000 600,000	නිදහස්	
අර්ථසාධක අරමුදලට සේවා යෝජකයාගේ දායකය		බද්දට යටත් නොවේ	
බැංකු සේවකයකු ලෙස ආදායම			2,180,000
අධ්‍යක්ෂක දීමනා - මාසික පාර්ශ්‍රමිකය රු. 25,000 කට වඩා වැඩිනම් බදු අනුපාතය 16% ක් වේ.			
ශුද්ධ දීමනාව		630,000	
16% බැගින් බදු අඩුකිරීම්	630,000/84*16	120,000	
දළ දීමනාව		750,000	750,000
මුළු සේවා නියුක්ත ආදායම			2,930,000
දේපළ වලින් ලද ආදායම			
<u>කුලියට දුන් නිවස</u>			
දළ කුලිය	80,000 x 8	640,000	
වර්පනම් ගෙවීම්	24,000x8/12	(16,000)	
		624,000	
අළුත්වැඩියා කිරීමේ දීමනා 25%		(156,000)	
ශුද්ධ කුලිය		468,000	
ශුද්ධ වාර්ෂික වටිනාකම - වර්පනම් තක්සේරුව 120,000 25% ක අලුත් වැඩියා දීමනාව (30,000) ශුද්ධ වාර්ෂික වටිනාකම 90,000			
මාස 8 ක් සඳහා ශු.වා.ව 90,000x8/12 = 60,000			
එම නිසා ශුද්ධ කුලිය > ශු.වා.ව කුලී ආදායම = ශුද්ධ කුලිය			468,000

NOT FOR SALE

ශු.වා.ව මාස 4 ක් සඳහා 90,000 (60,000) 30,000 ශ.වා.ව මාස 04 (තමා පදිංචිව සිටි) ශ.වා.ව දෙමව්පියන් පදිංචිව සිටි ශු.වා.ව එක් නිවසක් සඳහා ආදායම් බද්දෙන් නිදහස් වේ. දෙමව්පියන් පදිංචිව සිටි වැඩිම ශ.වා.ව සහිත නිවස බදු නිදහස් වීමට සුදුසුකම් ලබයි.		30,000 42,000 72,000 (42,000)	30,000
ව්‍යාපාරයෙන් ලද ලාභය	සටහන 1		712,940
ලාභාංශ - ව්‍යවස්ථාපිත ආදායමේ කොටසක් නොවේ.			-
කොටස් විකිණීමේ ලාභ - නිදහස්			-
බිරිඳට ගෙවූ වැටුප්			145,000
මුළු ව්‍යවස්ථාපිත ආදායම			**4,285,940**
අඩුකළා : 32 වන වගන්තිය අනුව අඩුකිරීම් නිවාස ණය මත පොළී ගෙවීම්			235,000
තක්සේරු කළ ආදායම			**4,050,940**
අඩුකළා : බදු නිදහස් ආදායම			(500,000)
අඩුකළා: සුදුසුකම් ලබන ගෙවීම් සේවා නියුක්ත ආදායම මත		100,000	
වෘත්තිකයන්ට හිමි වන නිවාස ණයෙහි ප්‍රාග්ධන කොටස නැවත ගෙවීම (උපරිම හිමිකම් පෑම රු. 600,000 කට සීමාවේ.)	750,000 600,000	600,000	(700,000)
ජීවිත රක්ෂණ වාරිකය	54,000		
අනුමත පුණ්‍ය ආයතනයට කළ පරිත්‍යාග	25,000		
උපරිම අඩුකිරීම තක්සේරු ආදායමින් 1/3 හෝ රු. 75,000 සීමා වේ.	79,000	75,000	(75,000)
බදු අයකළ හැකි ආදායම			**2,775,940**
ආදායම් බදු වගකීම ගණනය කිරීම			
පළමු රු. 500,000	@ 4%	20,000	
ඊළඟ රු. 500,000	@ 8%	40,000	
ඊළඟ රු. 500,000	@12%	60,000	
ඊළඟ රු. 500,000	@16%	80,000	
ඉතිරි රු. 775,940 (වෘත්තිකයන්ගේ සේවා නියුක්ත ආදායම සඳහා උපරිම බදු අනුපාතය 16% කි.)	@16%	124,150	324,150
අඩුකළා :			
වර්ෂය තුළ සිදුකල ස්වතක්සේරු ගෙවීම්			25,000
ගෙවා ඇති උපයන විට බද්ද			75,000
අධ්‍යක්ෂක පාරිශ්‍රමික මත අඩුකළ රඳවා ගැනීම් බදු			120,000
ගෙවිය යුතු ඉතිරි බද්ද			**104,150**

NOT FOR SALE

සටහන 1 - ව්‍යාපාරයේ ගලපන ලද ලාභය

	(+)	(-)
ගිණුම් අනුව බදු පෙර ලාභය	589,510	
ක්ෂය කිරීම් - ලී බඩු හා සවිකිරීම්	47,890	
ක්ෂය කිරීම් - පරිගණක උපකරණ	25,650	
ප්‍රාග්ධන දීමනා - ලී බඩු සහ සවිකිරීම් - සම්පූර්ණයෙන් හිමිකම් අවසන්ය		
ප්‍රාග්ධන දීමනා - පරිගණක උපකරණ - සම්පූර්ණයෙන් හිමිකම් අවසන්ය		
කුලිය මත ගෙවූ VAT බදු - ලියා පදිංචි නොවූ පුද්ගලයන්ට ඉඩදී ඇත		
ප්‍රචාරණය රු.10,000 න් 25 %	2,500	
බිරිඳට ගෙවූ වැටුප - ඉඩ දී ඇත.		
කල් බදු පොලිය	17,400	
කල් බදු මත මුද්දර ගාස්තු	1,740	
රක්ෂණය - පුද්ගලික වියදම් ඉඩදෙනු නොලැබේ	12,600	
දන්සලට පරිත්‍යාග	15,000	
EPF සඳහා උඩය	650	
ව්‍යාපාරයේ ගලපන ලද ලාභය	**712,940**	

(ලකුණ 20)

NOT FOR SALE

B කොටස

නීතිය

1 කොටස

ප්‍රශ්න අංක 04

4.1

ඉ.එ 1.4.1
නිවැරදි පිළිතුර B සෙසු ව්‍යවස්ථාදායක පනත් අදාල නොවේ.

4.2

ඉ.එ 4.1.1
නිවැරදි පිළිතුර C මෙය නිවැරදිය. විනිමය බිල්පත ප්‍රතිග්‍රහණය කිරීම සඳහා අණාලද්දා එම බිල මත අත්සන යෙදීම අත්‍යවශ්‍ය වේ.

4.3

ඉ.එ 3.3.1
නිවැරදි පිළිතුර A මෙම ප්‍රකාශය වැරදිය. භාණ්ඩවල අයිතිය ගිවිසුමට වලංගු ෙන අවස්ථාවේ දීම ගැණුම්කරු වෙත මාරු වේ.

4.4

ඉ.එ 8.2.1
නිවැරදි පිළිතුර D අනෙක් සියලු වැරදි පනතේ දක්වා ඇත.

4.5

ඉ.එ 6.3
නිවැරදි පිළිතුර B කල්බදු හිමිකරුට අධිකරණ නියෝගයකින් තොරව සන්තකය නැවත ලබාගත හැක. ඒ සඳහා වූ කාර්යපටිපාටිය පනතේ විස්තරාත්මකව දක්වා තිබේ.

(මුළු ලකුණු 10)

NOT FOR SALE

ප්‍රශ්න අංක 05

5.1

ඉ.එ 1.2.1

(i) සාමාන්‍යයෙන් සිවිල් නඩුවක, පැමිණිල්ල ගොනු කරන පුද්ගලයා පැමිණිලිකරු නම් වන අතර නඩු පැවරීමට යටත් වන පුද්ගලයා විත්තිකරු නම් වේ . සිවිල් නඩු විධාන සංග්‍රහයේ දැක්වෙන සාමාන්‍ය පටිපාටියට අනුව විභාගවන නඩු සම්බන්ධයෙන් මෙය අදාල වේ.

එහෙත් සිවිල් නඩු විධාන සංග්‍රහය යටතේ වන ලඝු පටිපාටියේ නඩු වැනි විශේෂ අවස්ථා පවතින අතර එහිදී පැමිණිලිකරු පෙත්සම්කරු වශයෙන් ද, විත්තිකරු වග උත්තරකරු වශයෙන් ද හඳුන්වනු ලැබේ.

(i) පැමිණිලිකරු මත වන නඩුව ඔප්පු කිරීමේ භාරය 'වැඩි බර සාක්ෂි ' මත පදනම් වේ.

5.2

ඉ.එ. 2.6.1

ලිඛිත ගිවිසුමක් කඩකිරීම සම්බන්ධව ගනු ලබන නීතිමය ක්‍රියාමාර්ග අදාලව කාලාවරෝධී ආඥාපනත ගිවිසුම කඩවීම සිදුවී වසර හයක කාල සීමාවක් දක්වනු ලබන අතර එම කාලය තුළ අගතියට පත් පාර්ශවයට නීතිමය ක්‍රියාමාර්ග ගත හැක .

එහෙත් කඩවීම සිදුවූ දිනයේ සිට වසර හයක් ඇතුලත අගතියට පත් පාර්ශවය නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට අසමත් වෙයි නම් එම නිශ්චිත කඩකිරීමට අදාලව නීතිය ඉදිරියේ තවදුරටත් ඔහුට පිහිටක් නොපවතී.

5.3

ඉ.එ 8.1.1

ලබාගත හැකි ප්‍රධාන විත්තිවාචකයන් පහත දැක්වේ.

අ) සහායක නොසැලකිල්ල - පැමිණිලිකරුගේ නොසැලකිල්ල ද වරද සඳහා හේතු වී තිබෙන විට.
ආ) අවදානම ස්වේච්ඡාවෙන් භාර ගැනීම - ඇතිවිය හැකි අවදානම පැමිණිලිකරු දැනගෙන එම අවදානම භාරගැනීමට තීරණය කිරීම.
ඇ) නොවැලැක්විය හැකි අනතුර - වැලැක්විය නොහැකි අනතුරක් නිසා හානිය සිදුවීම.
ඈ) නීති විරෝධීභාවය - හානිය ඇති කළ මුල් ක්‍රියාව නීති විරෝධී වීම හා නීති විරෝධී ක්‍රියාවක් මත නඩු නිමිත්තක් උද්ගත විය නොහැකි වීම.

NOT FOR SALE

5.4

ඉ.ඵ 9.1.1
ජාත්‍යන්තර වෙළඳාමේ දී භාවිතා වෙන ප්‍රධාන ණයවර ලිපි වර්ග පහත දැක්වේ. අ) අවලංගු කළ හැකි සහ තහවුරු නොකළ ණයවර ලිපි ආ) අවලංගු කළ නොහැකි සහ තහවුරු නොකළ ණයවර ලිපි ඇ) අවලංගු කළ නොහැකි සහ තහවුරු කළ ණයවර ලිපි ඈ) පැවරිය හැකි ණයවර ලිපි

5.5

ඉ.ඵ 3.4.1
භාණ්ඩ විකිණීමේ ගිවිසුමක් කඩ කළ විකුණුම්කරුවෙක්ට එරෙහිව ගැණුම්කරුවෙක් පහත සඳහන් ප්‍රතිකර්මවලට හිමිකම් කියයි. අ) විකුණුම්කරු භාණ්ඩ සැපයීමට අසමත් වී තිබෙන විටෙක භාණ්ඩ ලබා නොදීම නිසා සිදු වූ අලාභය අයකර ගැනීමට එරෙහිව නඩු පැවරීම. ආ) භාණ්ඩ විකිණීමේ ගිවිසුම එලෙසම ක්‍රියාත්මක කිරීම සඳහා වූ නඩුවක් අධිකරණයේ පැවරීම. ඇ) විකුණුම්කරු භාණ්ඩ ලබා දී නොමැති විටෙක විකුණුම්කරු සඳහා දැනට ගෙවනු ලැබ තිබෙන භාණ්ඩවල මිල නැවත ලබාගැනීම සඳහා නඩු පැවරීම. ඈ) භාණ්ඩ විකිණීමේ ගිවිසුමට අදාළ ප්‍රතිඥාහාර කඩකිරීම සම්බන්ධයෙන් අලාභ ඉල්ලා නඩුවක් පැවරීම. ඉ) භාණ්ඩ ගිවිසුමේ ගිවිසුමට අදාළ කොන්දේසි කඩකිරීම සඳහා අලාභ ඉල්ලා නඩු පැවරීම.

(මුළු ලකුණු 20)

NOT FOR SALE

2 කොටස

ප්‍රශ්න අංක 06

ඉ.එ 2.2.2

(a) කොටස

දෙන ලද සිදුවීම වැරදීමක් මත ඇති කරගත් ගිවිසුම් යටතට වැටේ.

මෙම සිදුවීමේ දී ප්‍රවීන් හා මාකර් යන දෙදෙනාම ගිවිසුමේ විෂය වස්තුව වන 'ලංකා රාණි' නැවේ අනන්‍යතාවයට සම්බන්ධව අන්‍යෝන්‍ය වරදක් සිදුකොට තිබේ.

එහි ප්‍රතිඵල ලෙස ප්‍රවීන් හා මාකර් අතර වලංගු ගිවිසුමක් ඇති වී නොමැත.

එම නිසා ප්‍රවීන් හා මාකර් අතර ඇති වූ ගිවිසුම නීතිය අනුව ශූන්‍ය හා බලරහිත වන්නේය.

මෙම සිදුවීමේ කරුණු රැෆල්ස් එදිරිව විචල්හවුස් නඩුවේ (**Raffles vs Wickelhaus** (1864) 2 H and C 906.) කරුණු හා සමානය.

(ලකුණු 5)

(b) කොටස

දෙන ලද සිදුවීමේ දී ගිවිසුමේ එක් පාර්ශවයක් වන ප්‍රවීන් ගිවිසුමට ඇතුලු වී තිබෙන්නේ තමන් සම්පූර්ණයෙන්ම වෙනස් වර්ගයේ ගිවිසුමකට එලැඹෙන බවට අවංකව ඇති වූ වැරදි අනවබෝධයක් මතය.

මෙම පිටසන යෙදීමේ දී ප්‍රවීන් නොසැලකිලිමත් නොවූ නිසා මෙම ගිවිසුම ඔහු මත බන්ධනාත්මක නොවේ. එම නිසා එය බලරහිතය.

එම නිසා විනිමය බිල්පත මත ඔහු යෙදූ පිටසන සම්බන්ධයෙන් ප්‍රවීන් වගකිව යුතු නොවේ.

මෙම සිදුවීමට අදාල කරුණු හා තීන්දුව ෆොස්ටර් එරෙහිව මැකිනන් නඩුවට **Foster vs Mackinnon** (1869) L.R.4 p. 704 සමානය.

(ලකුණු 5)

(මුළු ලකුණු 10)

NOT FOR SALE

ප්‍රශ්න අංක 07

ඉ.එ 3.3.1

(a) කොටස

භාණ්ඩ විකිණීමේ ආඥාපනත චංචල භාණ්ඩ විකිණීම කෙරෙහි අදාල වේ. ඉඩම් නිශ්චල දේපලක් වන නිසා ආඥා පනත ඉඩමක් විකිණීම සම්බන්ධයෙන් අදාල නොවේ. එම නිසා කමල් තමාගේ ඉඩමට ලංසු තැබීම හෝ නොතැබීම සම්බන්ධයෙන් මෙම අවස්ථාවේ දී භාණ්ඩ විකිණීමේ ආඥා පනත අදාල නොවේ.

විකල්ප වශයෙන්,

මෙම සිදුවීම වෙන්දේසියක් මගින් ඉඩමක් විකිණීම පිළිබඳ වන අතර ප්‍රශ්නය නිශ්චිත ලෙසම භාණ්ඩ විකිණීමේ ආඥා පනත පිළිබඳ වූවකි. එහෙත් 'ඉඩම්' භාණ්ඩ විකිණීමේ ආඥා පනත යටතේ 'භාණ්ඩ' ගණයට අයත් නොවේ

(එහෙත් පාඨ ග්‍රන්ථය 'භාණ්ඩ' පිළිබඳ නිර්වචනයක් ඉදිරිපත් නොකරන නිසා භාණ්ඩ විකිණීමේ ආඥා පනත අනුව ඉඩම් 'භාණ්ඩ' යන අර්ථයට වැටේ ද යන්න සිසුන් විසින් හඳුනාගනු ලැබේ යැයි අපේක්ෂා කිරීම අසාධාරණය. එම නිසා ශිෂ්‍යයෙක් ඉඩම් 'භාණ්ඩ' ගණයට වැටේ යැයි උපකල්පනය කරමින් කමල්ට තමාගේම වූ ඉඩමකට ලංසු තැබිය හැකිද නැද්ද යන්න පිළිබඳව භාණ්ඩ විකිණීමේ ආඥා පනත තුළ 'වෙන්දේසිය යටතේ විකිණීම' යටතේ එන රීති පදනම් කොට ගෙන කරුණු දක්වා ඇතිනම් සම්පූර්ණ ලකුණු ලබාදිය යුතුය.මෙම සන්දර්භය තුළ නිර්දේශිත පිළිතුර පහත පරිදිය)

භාණ්ඩ විකිණීමේ ආඥා පනත අනුව වෙන්දේසියේ විකිණීම සම්බන්ධයෙන් පහත කී රීති අදාල වේ.

තමාට වෙන්දේසියේ ලංසු තැබීමට අයිතිය තිබෙන බවට විකිණුම්කරු විසින් පූර්ව දැනුම් දීමක් සිදු කොට නොමැති නම් ඔහුට ඔහුගේම භාණ්ඩ සම්බන්ධයෙන් ලංසු තැබිය නොහැක.

දෙන ලද සිදුවීමේ දී කමල් තමාගේම වත්කම සම්බන්ධයෙන් ලංසු තැබීමේ චේතනාව පූර්වයෙන් දැනුම් දුන් බවට පෙන්නුම් කරන සාක්ෂි නැත.

එම නිසා එබඳු තත්වයක් තුළ, චන්න හා ඩේවිඩ් විසින් මතුකළ විරෝධතාවය වලංගු වන අතර මෙම වෙන්දේසියේ දී කමල් විසින් තමාගේම වත්කම සඳහා ලංසු තැබීම වලක්වනු ලැබිය හැක.

එහෙත් ඊට පටහැනි ලෙස වෙන්දේසියේ දී සිය වත්කම සඳහා ලංසු තැබීමට අදාල චේතනාව කමල් විසින් පූර්වයෙන් දැනුම් දුන් බවට සාක්ෂි පවතී නම් ලංසු තැබීමෙන් ඔහුව වලක්වනු ලැබිය නොහැක. ඒ අනුව චන්න ගේ හා ඩේවිඩ්ගේ විරෝධතාවය ප්‍රතික්ෂේප වනු ඇත.

(ලකුණු 5)

NOT FOR SALE

ඉ.එ 4.3.1

(b) කොටස

රුවනිව විනිමය බිල්පත් ආඥා පනත යටතේ 'යථාකාල ධාරකයෙක්' ලෙස හඳුන්වනු ලැබීමට නම් ඇය 'යථාකාල ධාරකයා' යන නිර්වචනය යටතට වැටීමට සුදුසුකම් සම්පූර්ණ කළ යුතුය.

විනිමය බිල්පත් පනත යථාකාල ධාරකයා යන්න ''බිල්පත කල් ඉකුත් වීමට පෙර එය අගරු වී තිබෙන විට, මීට පෙර එය අගරු වූ බවක් නොදැන, සද්භාවයෙන් හා සාධාරණ මිලකට, බිල්පත ඔහුට හුවමාරු කළ අවස්ථාවේ ගනුදෙනු කළ තැනැත්තාගේ හිමිකම පිළිබඳ ඌනතාවයක් පැවැති බවක් නොදැන, බැලූ බැල්මට අංග සම්පූර්ණ වූ හා ක්‍රමවත් බිල්පතක් ලබාගත් අයෙක්'' ලෙස නිර්වචනය කරයි.

දෙන ලද සිදුවීම අනුව පහත නිරීක්ෂණ ඉදිරිපත් කල හැක.

- රුවනිට දුන් චෙක්පත බැලූ බැල්මට සම්පූර්ණ හා ක්‍රමවත් එකක් ලෙස පෙනේ.
- එය ඊට පෙර අගරු වූ බවට කිසිදු හැඟවුමක් නොවීය.
- චෙක්පත කල් පිරීමට පෙර රුවනි චෙක්පත තමන්ගේ බැංකු ගිණුමේ තැන්පත් කළාය.
- සමන්තිට චෙක්පතේ අයිතිය සම්බන්ධයෙන් තිබූ ඌනතාවය ගැන තමාට චෙක්පත ලැබෙන අවස්ථාව වන විට රුවනි දැන සිටියේ නැත.

එම නිසා දෙනු ලැබූ කරුණු අනුව සාධාරණ ලෙස කිව හැක්කේ රුවනි 'යථාකාල ධාරකයා' පිළිබඳ නිර්වචනයට අයත් වන බවයි.

(ලකුණු 5)

(මුළු ලකුණු 10)

NOT FOR SALE

ප්‍රශ්න අංක 08

ඉ.ඵ 5.1.1
(a) කොටස නියෝජ්‍යත්ව නීතිය අනුව නියෝජ්‍යත්ව සම්බන්ධතාවයක් අවශ්‍යතාවය මත නිර්මාණය විය හැක. අවශ්‍යතාවය මත නියෝජ්‍යත්වය නිර්මාණය වීමට නම් පහත කොන්දේසි සම්පූර්ණ විය යුතුය. අ) ප්‍රධානියාගේ උපදෙස් ලබාගැනීම කළ නොහැකි තත්වයක් උද්ගත වී තිබිය යුතුය. ආ) නියෝජ්‍යත්වය නිර්මාණය වීම සඳහා සැබෑ සහ නිශ්චිත වාණිජ්‍යමය අවශ්‍යතාවක් තිබිය යුතුය. ඇ) නියෝජිතයා සියලුම පාර්ශවවල යහපත වෙනුවෙන් සද්භාවයෙන් ක්‍රියා කළ යුතුය. මෙම සිදුවීමේ දී ප්‍රවාහන සමාගමට ලොරිය කොළඹට ලගා වූ පසු ඉතා පහසුවෙන් හර්මන් සමග සන්නිවේදනය කොට එලවලු වලට කල යුත්තේ කුමක්දැයි ඇසීමට හැකියාව පැවැතිණ. එහෙත් ප්‍රවාහන සමාගම අඩු තරමින් හර්මන් සම්බන්ධ කරගැනීමටවත් උත්සාහ නොකළ නිසා ඉහත දැක්වූ අවශ්‍යතාවය මත නියෝජ්‍යත්වය නිර්මාණය වීමට අදාල පලමු අවශ්‍යතාවය ඉටු වී නොමැත. එම නිසා අනෙක් අවශ්‍යතා දෙක ඉෂ්ට වී තිබෙන බව පෙනී ගියත් මෙම අවස්ථාවට අදාලව අවශ්‍යතාවය මත නියෝජ්‍යත්වයක් නිර්මාණය වන්නේ නැත. එම නිසා දෙන ලද අවස්ථාවේ දී ප්‍රවාහන සමාගම හර්මන්ට අලාභ ගෙවීමට බැඳී සිටී. මන්ද අවශ්‍යතාවය මත නියෝජ්‍යත්වයක් ඇති වී නොමැති නිසාය. මෙම කරුණු ස්ප්‍රින්ගර් එදිරිව ජී.ඩබ්. රයි (**Springer vs G.W.Ry**. (1921) 1 K.B. 257) නඩුවේ කරුණුවලට සමානය. එහිදී අවශ්‍යතාවය මත නියෝජ්‍යත්වයක් නිර්මාණය වී නොතිබීම හේතු කොට ගෙන දුම්රිය සමාගමක් අලාභ ගෙවීමට යටත් වූයේය. (ලකුණු 5)

NOT FOR SALE

ඉ.එ 5.7.8

(b) කොටස

නිමල් හා නිමාලිට අධිකරණය ඉදිරියේ නඩු පැවරීමකින් තොරව ස්වකීය හවුල් ව්‍යාපාරය විසුරුවා හැරීම සඳහා පහත ක්‍රම වලින් ඕනෑම ක්‍රමයක් යොදාගත හැක.

අ) කාලය ඉකුත් වීම හෝ හවුල් ව්‍යාපාරය අවසන් කිරීම සඳහා දැන්වීමක් ලබාදීම.

පාර්ශවයන් අතර තිබෙන යම් එකඟතාවයක් වේ නම් ඊට යටත්ව නිමල්ට සහ නිමාලිට පහත කී අවස්ථා අතරින් ඕනෑම එක් අවස්ථාවක් මත ස්වකීය හවුල් ව්‍යාපාරය විසුරුවා හැරීමට පුලුවන.

1. හවුල් ව්‍යාපාරය යම් නිශ්චිත කාල සීමාවක් සඳහා ඇති කරගත් එකක් නම් එම කාලසීමාව අවසාන වීම.

11. හවුල් ව්‍යාපාරය ඇති කරගනු ලැබුයේ යම් නිශ්චිත කාර්යයක් හෝ කටයුත්තක් උදෙසා නම් එම කාර්යය හෝ කටයුත්ත අවසාන වීම

111. හවුල් ව්‍යාපාරය අසීමිත කාලයකට ඇති කරගෙන තිබේ නම් ව්‍යාපාරය විසුරුවා හැරීමට අදාල දැන්වීමක් පාර්ශවයක් විසින් සෙසු පාර්ශව වෙත ලබාදීම.

ආ) බැඳීම්

එක් හවුල්කරුවෙක්ගේ කොටස ඔහුගේ පෞද්ගලික ණය වෙනුවෙන් බැඳී ඇති විට අනෙක් හවුල්කරුවන්ට හවුල් ව්‍යාපාරය විසුරුවා හැරිය හැක.

ඇ) නීති විරෝධීභාවය

ව්‍යාපාරය පවත්වා ගෙන යාම නීති විරෝධී තත්වයට පත් කරන යම් සිදුවීමක් සිදු වේ නම් හවුල් ව්‍යාපාරය විසුරුවා හැරීමට පුලුවන.

(ලකුණු 5)

(මුළු ලකුණු 10)

NOT FOR SALE

ප්‍රශ්න අංක 09

ඉ.එ 6.1.2
(a) කොටස ගිනි ගැනීමක් නිසා සිදුවන හානිවීම් ගිනි රක්ෂණාවරණයක් මගින් ආවරණය වේ. ගිනි රක්ෂණ ආවරණයක් තුළ 'ගින්නක්' ලෙස සලකනු ලැබීමට නම් දහනය වීමක් පැවැතිය යුතුය. දෙන ලද අවස්ථාවේ දී දහනය වීමක් සිදුවී තිබේ. එම නිසා කාංචනාගේ ස්වර්ණාභරණවලට හානි ඇති කළ ගින්න ගිනි රක්ෂණයක් මගින් ආවරණය වනු ලැබෙන වර්ගයේ ගිනි ගැනීමකි. තවද මෙම දහනය ස්වර්ණාභරණ විනාශ කිරීමේ චේතනාවෙන් කාංචනා විසින් සිතා මතා ඇති කළ එකක් නොවේ. රක්ෂිතයාගේ නොසැලකිල්ල ද ඇතුලු ගින්නක් නිසා සිදුවන ඕනෑම හානියක් මෙම වර්ගයේ රක්ෂණ ආවරණයක් මගින් ආවරණය වේ එම නිසා අවසාන වශයෙන් නිගමනය කළ හැක්කේ තමාගේ ගිනි රක්ෂණාවරණය යටතේ ටින්ටන් ඉන්ෂුවරන්ස් පුද්ගලික සමාගමෙන් වන්දි ලබාගැනීමට කාංචනාට හැකියාව තිබෙන බවයි. හැරිස් එදිරිව පෝලන්ඩ් Harris v Poland (1941) 1 KB 462. නඩුවේ දී මේ හා සමාන කරුණු උද්ගත විය. (ලකුණු 5)

ඉ.එ 7.2.1
(b) කොටස (i) 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනතේ දෙවන කොටස අනුව ජේම්ස්ට පාරිතෝෂික සඳහා හිමිකම් ලැබීමට නම් පහත කී නිර්ණායක තෘප්ත විය යුතුය. • ජේම්ස්ගේ සේවා යෝජකයා විසින් සේවකයින් 15ක් හෝ ඊට වැඩි පිරිසක් හෝ සේවකයකුගේ සේවය අවසන් කිරීමට මාස 12ක කාලසීමාවක් තුළ සේවකයින් 15 ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සේවයේ යොදවා තිබිය යුතුය. • එම නිශ්චිත සේවා යෝජකයා යටතේ ජේම්ස් වසර පහකට අඩු නොවූ කාලයක් සේවය කොට තිබිය යුතුය (ලකුණු 3) (ii) ජේම්ස්ගේ පාරිතෝෂිකය පහත පදනම මත ගණනය වනු ඇත. ජේම්ස් මාසික වැටුපක් මත සේවය කළ නිසා ඔහුට ලැබිය යුතු පාරිතෝෂිකය පහත පරිදිය. පාරිතෝෂිකය = 1/2 ය (සේවා නියුක්තියේ අවසන් මාසය සඳහා ලබාගත් වැටුප/පඩිය) x සම්පූර්ණ කර ඇති සේවා වර්ෂ ගණන = 1/2 * 30,000* 6 = රු. 90, 000 (ලකුණු 2) (මුළු ලකුණු 10)

THE INSTITUTE OF CHARTERED ACCOUNTANTS OF SRI LANKA

නිවේදනය

මෙහි ලබාදුන් පිළිතුරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය මගින් (ශ්‍රී ලංකා ව.ග.) පමණක් ලබාදෙන ලද අතර, එම පිළිතුරු ඔබ විසින් එය "එසේම~" යන පදනම මත පිළිගත යුතු වේ.

එම පිළිතුරු "ආදර්ශ පිළිතුරු~" ලෙස අදහස් නොකරන නමුත් ඒවා බොහෝදුරට suggested solution ලෙස දැක්වේ.

පිළිතුරු වලින් ප්‍රධාන අරමුණු දෙකක් ඉටුකෙරේ. ඒවා නම්,

01. විභාග ප්‍රශ්නයකට යෝජිත විසඳුමක් සඳහා සවිස්තරාත්මක නිදසුනක් (උදාහරණයක්) සැපයීම සහ,

02. ශිෂ්‍යයන්ට විෂය පිළිබඳව තොරතුරු පර්යේෂණය කිරීම සඳහා අත්වැලක් සැපයීම සහ විෂය පිළිබඳව ඔවුන්ගේ අවබෝධය සහ අගය වර්ධනය කිරීම.

මෙම යෝජිත විසඳුම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (ශ්‍රී ලංකා ව.ග.) කිසිදු ප්‍රතිඥාභාරයක් ලබා නොදෙන නිසා ඒ සම්බන්ධව කිසිදු අගතියකට පත්වීමක් පිළිබඳව මැසිවිල්ලක් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට (ශ්‍රී ලංකා ව.ග.) එරෙහිව ඉදිරිපත් කිරීමට ඔබ හට හේතුවක් නොමැත. ඒ කෙසේ වෙතත් ඔබ විසින් යම් නඩුකරයක්, වන්දි ඉල්ලීමක්, පෙත්සමක්, තර්ජනය කිරීමක් හෝ බලවත් ඉල්ලීමක් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට (ශ්‍රී ලංකා ව.ග.) එරෙහිව ගොනුකරනු ලැබ එයින් සැලකියයුතු අන්දමේ ජයග්‍රහණයක් ලබා නොගතහොත් ඔබ විසින් එම නඩුකරයට අදාළ සම්පූර්ණ නෛතික ගාස්තු සහ වියදම් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට (ශ්‍රී ලංකා ව.ග.) ගෙවිය යුතු වේ. එනයින්ම මෙම අයිතිවාසිකම හෝ මෙහි විස්තර කෙරෙන හෝ ශ්‍රී ලංකාවේ නීතීන් යටතේ හිමි වෙනත් අයිතිවාසිකම් බලාත්මක කරවා ගැනීම සඳහා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට (ශ්‍රී ලංකා ව.ග.) නෛතික ක්‍රියාමාර්ගයකට යොමුවීමට සිදුවුවහොත්, ඊට අදාළ නෛතික ගාස්තු සහ වියදම්ද ඔබ විසින් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට (ශ්‍රී ලංකා ව.ග.) ගෙවිය යුතුවේ.

---

[2] 2013 ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (ශ්‍රී ලංකා ව.ග.) මගිනි.
සියළුම හිමිකම් ඇවිරිණි.

මෙම ලේඛණයේ කිසිම සටහනක් ප්‍රතිඋත්පාදනය කිරීම, කුමන හෝ ආකාරයකින් හෝ ක්‍රමයකින් එනම්, ඉලෙක්ටොනික, යාන්ත්‍රික, ඡායා පිටපත් කිරීම, වාර්තාගත කිරීම හෝ වෙනත් ක්‍රමයකින් සම්ප්‍රේෂණය කිරීම ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ (ශ්‍රී ලංකා ව.ග.) පූර්ව ලිඛිත අවසරයකින් තොරව සිදු නොකළ යුතුය.

NOT FOR SALE